මාධ්‍ය නිවේදනය
ஊடக வெளியீடு
PRESS RELEASE

Tel : 011 2 386572 Fax : 011 2 333717
ජනාධිපති මාධ්‍ය අංශය,ජනාධිපති කාර්යාලය,කොළඹ 01
ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01
President's Media Division, President's Office, Colombo 01

# ගුවන් තොටුපොළ පැමිණීමේ පර්යන්තය තවදුරටත් වසා දැමේ

- මගීන් රැගෙන ශ්‍රී ලංකාවෙන් පිටත්වන ගුවන් යානාවලට අවසර ...
- වරාය මෙහෙයුම් බාධාවකින් තොරව අඛණ්ඩව ...

කොරෝනා වෛරසය රට තුළට පිවිසීම නතර කරනු පිණිස ගුවන් තොටුපොළ පැමිණීමේ පර්යන්තය වසා දැමීමට ගත් තීරණය තවදුරටත් ක්‍රියාත්මක බව රජය පවසයි.

පිටවීමේ පර්යන්තය විවෘතව තැබෙන අතර, ශ්‍රී ලංකාවෙන් පිටවන මගීන් රැගෙන යන ගුවන් යානාවලට අවසර දී තිබේ. සියලුම මගී සංක්‍රමණ ගුවන් කටයුතු ( passengers transit ) නතර කර ඇත.

වරාය මෙහෙයුම් ආනයන, අපනයන ක්‍රියාවලියට බාධාවක් නොවන අයුරින් පෙර පරිදි සිදු කෙරේ.

මගීන් රට තුළට පැමිණීම වැළැක්වීමට වරාය අධිකාරිය අනුගමනය කරන ක්‍රියාමාර්ග තවදුරටත් ක්‍රියාත්මකය.

කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම නිසා රට තුළ උද්ගතව ඇති තත්ත්වය සාමාන්‍ය අතට හැරෙන තුරු මේ තීරණ ක්‍රියාත්මක බව රජය කියා සිටී.

**මොහාන් සමරනායක**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජනාධිපති මාධ්‍ය අංශය**

**2020-03-22**